// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2255/9 – 2021 නොවැම්බර් 23 වැනි අඟහරුවාදා – 2021.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තවලම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන තවලම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තවලම ප්‍රාදේශීය සභාවේ අංක 04 හිනිදුම කොට්ඨාසයට තේරී පත්වී ඇති සමරසිංහගේ ජයන්ත අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම තවලම ප්‍රාදේශීය සභාවේ අංක 04 හිනිදුම කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා එදිරිසිංහ විජේවර්ධන ආරච්චිගේ චන්ද්‍රදාස නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

තවලම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් එදිරිසිංහ විජේවර්ධන ආරච්චිගේ චන්ද්‍රදාස, තවලම ප්‍රාදේශීය සභාවේ අංක 04 හිනිදුම කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්.එච්.ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

12-36

1A – G 35407 – 30 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ අංක 09 කරුකුපනේ කොට්ඨාසයට තේරී පත්වූ වර්ණකුලසූරිය සුජිත් ප්‍රනාන්දු අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ අංක 09 කරුකුපනේ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දිසානායක මුදියන්සේලාගේ චමිල් ඉන්දික නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, බාදන මුදියන්සේලාගේ ඉඳුනිල් සංජීව ලසන්ත බණ්ඩාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, දිසානායක මුදියන්සේලාගේ චමිල් ඉන්දික, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ අංක 9 කරුකුපනේ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

බී.එම්.අයි.එස්.එල්. බණ්ඩාර,
තේරීම්භාර නිලධාරි,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

12-37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.